පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 438

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
දසවැනි පාර්ලිමේන්තුව
(පළමුවැනි සභාවාරය)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පහළොස්වැනි වාර්තාව

(2025.10.08 වැනි දින ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂාව)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති
පාර්ලිමේන්තු මන්ත්‍රී
ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා විසින්
2026 ජනවාරි මස 08 වැනි දින ඉදිරිපත් කරන ලදී.

2026 ජනවාරි මස 08 වැනි දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී.

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සංයුතිය

1. ගරු (වෛද්‍ය) නිශාන්ත සමරවීර මහතා, පා.ම., (සභාපති)
2. ගරු අර්කම් ඉල්යාස් මහතා,පා.ම., (2025.05.08 දින සිට)
3. ගරු මනෝ ගනේෂන් මහතා, පා.ම., (2025.03.21 දින සිට)
4. ගරු (නීතිඥ) දයාසිරි ජයසේකර මහතා, පා.ම., (2025.05.20 දින සිට)
5. ගරු (නීතිඥ) අර්ජුන සුජීව සේනසිංහ මහතා, පා.ම., (2025.03.21 දින සිට)
6. ගරු ඩී.වී. චානක මහතා, පා.ම., (2025.03.21 දින සිට)
7. ගරු (නීතිඥ) අනුරාධ ජයරත්න මහතා, පා.ම., (2025.03.21 දින සිට)
8. ගරු නලීන් බණ්ඩාර ජයමහ මහතා, පා.ම., (2025.03.21 දින සිට)
9. ගර. එස්.එම් මරික්කාර් මහතා, පා.ම., (2025.03.21 දින සිට)
10. ගරු මුජිබුර් රහුමාන් මහතා, පා.ම., (2025.05.20 දින සිට)
11. ගරු චමින්ද විජේසිරි මහතා, පා.ම., (2025.03.21 දින සිට)
12. ගරු අබූබකර් අතම්බාවා මහතා, පා.ම., (2025.05.08 දින සිට)
13. ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.,
14. ගරු (නීතිඥ) නිලන්ති කොට්ටහච්චි මහත්මිය, පා.ම., (2025.03.21 දින සිට)
15. ගරු සමන්මලී ගුණසිංහ මහත්මිය, පා.ම.,
16. ගරු දිලිත් ජයවීර මහතා, පා.ම., (2025.03.21 දින සිට)
17. ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා, පා.ම., (2025.05.08 දින සිට)
18. ගරු සුජීව දිසානායක මහතා, පා.ම.,
19. ගරු සුදත් බලගල්ල මහතා, පා.ම.,
20. ගරු (වෛද්‍ය) එස්. ශ්‍රී බවානන්දරාජා මහතා, පා.ම.,
21. ගරු ලුතිනන් කමාන්ඩර් (විශ්‍රාමික)

ප්‍රගීත් මධුරංග මහතා, පා.ම., (2025.03.21 දින සිට)

22. ගරු ජගත් මනුවර්ණ මහතා, පා.ම.,
23. ගරු රුවන් මාපලගම මහතා, පා.ම.,
24. ගරු සුනිල් රාජපක්ෂ මහතා, පා.ම.,
25. ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.,
26. ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා, පා.ම.,

27. ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා, පා.ම., (2025.03.21 දින සිට)
28. ගරු තිළිණ සමරකෝන් මහතා, පා.ම.,
29. ගරු චන්දිම හෙට්ටිආරච්චි මහතා, පා.ම.,
30. ගරු (නීතිඥ) ලක්මාලි හේමචන්ද්‍ර මෙනෙවිය, පා.ම.,
31. ගරු දිනේෂ් හේමන්ත මහතා, පා.ම., (2025.03.21 දින සිට)

කාරක සභා ලේකම් කාර්යාලයේ කාර්ය මණ්ඩලය

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වත්මන් කාර්ය මණ්ඩලය පහත පරිදි වේ.

- ❖ ප්‍රධාන නිලධාරි - එච්. රූපානි ද සොයිසා මිය
- ❖ නියෝජ්‍ය ප්‍රධාන නිලධාරි - එස්. එල්. වික්‍රම මයා
- ❖ පාර්ලිමේන්තු නිලධාරි - ජී. වී. එස්. කේ. කුමාරි මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරි - අයි. එස්. ගෝමස් මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරි - ජී. එල්. ඩී. ප්‍රනාන්දු මිය
- ❖ පාර්ලිමේන්තු නිලධාරි - එම්.එන්.පී. පෙරේරා මෙය

කාරක සභා වාර්තා

www.parliament.lk යන වෙබ් අඩවියෙන් පහත සඳහන් ගමන් මාර්ගය ඔස්සේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වාර්තා බාගත කළ හැක.

www.parliament.lk

↓

සිංහල

↓

පාර්ලිමේන්තුවේ කටයුතු

↓

කාරක සභා

↓

කාරක සභා වාර්තා

පටුන

		පිටු අංක
1.	සභාපතිතුමාගේ සටහන	IV
2.	විධායක සාරාංශය	V
3.	මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය	01
4.	පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මඟින් පරීක්ෂා කරන ලද ආයතනය - ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය	02-19

සභාපතිතුමාගේ සටහන

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභා වාරයේදී 2025.10.08 වැනි දින පරීක්ෂා කළ නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශය යටතේ ඇති ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය 2022 සහ 2023 වර්ෂයන්ට අදාළ විගණකාධිපති වාර්තා හා වර්තමානයේ කාර්යසාධනයට අදාළව සවිස්තරාත්මක වාර්තාව මේ සමග ඉදිරිපත් කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව සතු මූල්‍ය පාලනයට සෘජුව සම්බන්ධ වන පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විමර්ශන කටයුතු මඟින්, රටේ පොදු ව්‍යාපාරයන්හි මූල්‍ය හා අනෙකුත් වත්කම් කළමනාකරණය වැදගත් කාර්යයක් බව හඳුනා ගෙන ඇත.

සමස්ත ඉදිකිරීම් කර්මාන්තයම විධිමත් ලෙස නියාමනය කිරීම, කළමනාකරණය කිරීම සහ සංවර්ධනය කිරීම, ඉදිකිරීම්වල ගුණාත්මකභාවය, ප්‍රමිතිකරණය සහ ආරක්ෂාව ඉහළ නැංවීම සඳහා අවශ්‍ය ප්‍රමිති සහ කේත සකස් කිරීම, කොන්ත්‍රාත්කරුවන් සහ වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සහ ශ්‍රේණිගත කිරීම, මෙන්ම කර්මාන්තයේ නියැලෙන්නන්ගේ නිපුණතා වර්ධනය කිරීම යන අරමුණු ඉටු කර ගැනීම සඳහා 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත මඟින්, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) පිහිටුවා ඇත. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාත්මක වන එකම නියාමන ආයතනය වන්නේ මෙම අධිකාරියයි.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ විමර්ශනයන් මඟින් ලැබිය යුතු උපරිම සේවය රටට ලැබෙන්නේ මෙම කමිටුවේ නිර්දේශ කෙරෙහි වගකිව යුතු සියලු පාර්ශ්වයන්ගේ අවධානය යොමු කරවීම හරහාය. එහිදී රටේ පරමාධිපත්‍ය බලය හිමි මහජනතාවගේ නියෝජිතයන් වශයෙන් මේ ගරු සභාව විසින් කරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කරවීමට කටයුතු කිරීම හරහා මෙම උත්සාහය වඩාත් ඵලදායී වන බව කියනු කැමැත්තෙමි.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්ය භාරය සාර්ථකව ඉටුකර ගැනීම සඳහා එම කමිටුවේ සාමාජික ගරු මන්ත්‍රීවරුන්ගෙන් ලැබෙන සහායත්, කථානායකතුමා ප්‍රධාන පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය හා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ උපදේශකවරු දෙදෙනාගේ සහායත්, භාණ්ඩාගාර නිලධාරින්ගේ සහ ජාතික විගණන කාර්යාලයෙන් ලැබෙන සහයෝගයත් අගය කොට සලකමි.

වෛද්‍ය නිශාන්ත සමරවීර
සභාපති
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

විධායක සාරාංශය

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් 2025.10.08 වැනි දින ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියට අදාළව 2022 සහ 2023 වසරවල විගණකාධිපති වාර්තා සහ අධිකාරියේ වත්මන් කාර්යසාධනය කෙරෙහි අවධානය යොමු කරන ලදී.

අධිකාරිය වෙත පවරා ඇති ව්‍යවස්ථාපිත වගකීම් සහ අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය පිළිබඳව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව පුළුල් ලෙස කළ පරීක්ෂාවේදී 2014 අංක 33 දරන පනත මඟින් අධිකාරිය පිහිටුවීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුකරගැනීමට අපොහොසත්ව ඇති බවට නිරීක්ෂණය විය. ආයතනය පිහිටුවා වසර 11ක් ගත වී තිබුණද, පනතේ දක්වා ඇති ප්‍රධාන කාර්යයන් 33 න් 15 ක් පමණක් සම්පූර්ණ කර ඇති බවත්, අධිකාරිය විසින් ඉටු කළ යුතු ප්‍රධාන පරමාර්ථ වන තිරසාර ගොඩනැගිලි සංවර්ධනය සහ ක්ෂේත්‍ර පර්යේෂණ වැනි අංශවල ප්‍රගතිය ඉතා අඩු මට්ටමක පවතින බවත්, කාරක සභාව වැඩිදුරටත් නිරීක්ෂණය කළාය.

අධිකාරියට අනුමත තනතුරු 390 න් 201 ක් (51.5%) පුරප්පාඩු වී තිබීම ආයතනික සහ මෙහෙයුම් මට්ටමින් හඳුනාගත් බරපතලම ගැටලුව බව හඳුනාගත් කාරක සභාව, අධ්‍යක්ෂ මට්ටමේ තනතුරු කිහිපයක් මෙන්ම අභ්‍යන්තර විගණක තනතුර වසර 03කට වැඩි කාලයක් පුරප්පාඩු වී තිබීම ආයතනයේ කාර්ය සාධනය අවම වීමටත්, පරිපාලන ගැටලු ඇතිවීමටත් හේතු වී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

එමෙන්ම, මෙම අධිකාරියේ නිලධාරීන්ගේ පෞද්ගලික ගැටුම් සහ අසමගිය අධිකාරියේ සමස්ත කටයුතුවලට ඍණාත්මකව බලපා ඇති බවත්, එමඟින් පනතේ අරමුණු ඉටු කිරීමේ ප්‍රගතිය තවදුරටත් අඩාල වී ඇති බවත් කාරක සභාව නිරීක්ෂණය කළාය. මෙම තත්ත්වය සමනය කර ගැනීම සඳහා, අධිකාරිය විසින් නියාමන සහ පර්යේෂණ කටයුතු ශක්තිමත් කෙරෙන නව කාර්ය මණ්ඩල සංයුතියක් යෝජනා කර තිබූ අතර, කළමනාකරණ සේවා

දෙපාර්තමේන්තුව සති දෙකක් තුළ එම සංශෝධන අනුමත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බවට පවසන ලදී.

අධිකාරියෙහි නියාමන සහ සංවර්ධන කාර්ය සාධන දත්ත විශ්ලේෂණය කිරීමේදී, ප්‍රගතියෙහි විශාල අසමතුලිතතාවයක් දක්නට ලැබුණි. කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම අපේක්ෂිත ඉලක්ක ඉක්මවා තිබුණද, දේපල සංවර්ධකයින් ලියාපදිංචි කිරීම (35%) සහ සුදුසුකම්ලත් පුද්ගලයින් ලියාපදිංචි කිරීම (0%) වැනි නියාමන අංශවල ප්‍රගතිය ඉතාමත් පහළ මට්ටමක පැවතුණි. මෙයට ප්‍රධාන හේතුව වූයේ, පුද්ගලික අංශය සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීමට සහ නියාමන නීති කඩ කරන්නන්ට එරෙහිව බලාත්මක කිරීමේ ප්‍රමාණවත් ප්‍රතිපාදන පනතේ නොමැති වීමය. තවද, අධිකාරියෙහි ප්‍රධාන නියාමන මෙවලම් දෙකක් වන ජාතික ඉදිකිරීම් දත්ත පද්ධතිය පවත්වාගෙන යාමේදී රජයේ ආයතනවල දත්ත පමණක් ඇතුළත් වීම සහ ජාතික ගොඩනැගිලි සංග්‍රහය (NBC) සකස් කිරීමේ කාර්යය දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රමාද වී තිබීම පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය.

මෙම සියලු කරුණු දීර්ඝව සාකච්ඡා කළ කාරක සභාව ප්‍රමාද වූ සියලුම පරමාර්ථ හා කාර්යයන් ඉටු කිරීම සඳහා නිශ්චිත කාලසීමාවන් ඇතුළත් කරමින් නව සංයුක්ත සැලැස්මක් සකස් කිරීම, අනුමත වූ නව කාර්ය මණ්ඩල සංයුතිය යටතේ කඩිනමින් පුරප්පාඩු සම්පූර්ණ කිරීම, සහ රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රය නියාමනය කිරීමේ එකම ආයතනය ලෙස ජාතික ගොඩනැගිලි සංග්‍රහය බලාත්මක කිරීමේ කටයුතුවලට අධිකාරිය නායකත්වය ලබා දීම යන කටයුතු කරන ලෙස කාරක සභාව නිර්දේශ කළාය.

දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරය පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පහළොස්වැනි වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව දසවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සභාවාරයේ (පළමු මාස 12 තුළදී) දී පහත සදහන් පරිදි කාරක සභා රැස්වීම් පවත්වා ඇත.

අනු අංකය	කැඳවූ ආයතනය	කාරක සභාව පැවැත් වූ දිනය
I.	ජාතික තරුණ සේවා සභාව	2025.02.18
II.	ජාතික තරුණ සේවා සභාව	2025.02.20
III.	ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය	2025.02.27
IV.	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය	2025.03.05
V.	ජාතික ඖෂධ නියාමන අධිකාරිය	2025.03.12
VI.	ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය	2025.03.27
VII.	ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම	2025.04.02
VIII.	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	2025.05.08
IX.	ගුවන්තොටුපළ සහ ගුවන් සේවා (පුද්) සමාගම	2025.05.09

X.	ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල	2025.05.15
XI.	ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය	2025.05.23
XII.	ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය	2025.06.04
XIII.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	2025.06.20
XIV.	මහපොළ භාරකාර අරමුදල	2025.07.09
XV.	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	2025.07.17
XVI.	රාජ්‍ය දැව සංස්ථාව	2025.07.23
XVII.	සිවිල් ගුවන් සේවා අධිකාරිය	2025.08.20
XVIII.	ශ්‍රී ලංකා වරාය අධිකාරිය	2025.09.10
XIX.	භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය	2025.09.12
XX.	ලංකා විදුලිබල මණ්ඩලය	2025.09.24
XXI.	ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය	2025.10.08
XXII.	ලංකා සතොස ලිමිටඩ්	2025.10.10
XXIII.	ලංකා විදුලිබල මණ්ඩලයේ පරීක්ෂණයට අදාළව එල්.ටී.එල්.	2025.10.24

	හෝල්ඩිංස් සමාගම හා එහි පරිපාලිත සමාගම්	
XXIV.	ජාතික ඉතිරිකිරීමේ බැංකුව	2025.11.19
XXV.	ජාතික ඉතිරිකිරීමේ බැංකුව	2025.11.26

ඒ අතුරින්, 2025.10.08 වැනි දින නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය යටතේ ඇති ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ 2022 සහ 2023 වර්ෂවලට අදාළ විගණකාධිපති වාර්තා සහ එහි වර්තමාන කාර්යසාධනය පරීක්ෂාවට ලක් කොට නිකුත් කළ කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

<u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය</u>

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් 2022, 2023 හා 2024 වර්ෂයන්ට අදාළව ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිවරයාගේ මතය පහතින් දක්වා ඇත.

ආයතනයේ නම	විගණන මතය		
	2022	**2023**	**2024**
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය	තත්ත්වාගණනය කළ මතය	තත්ත්වාගණනය කළ මතය	තත්ත්වාගණනය කළ මතය

<u>විගණන මත වර්ග</u>

01 <u>තත්ත්වාගණනය නොකළ මතය</u> **(Unqualified Opinion)**
මූල්‍ය ප්‍රකාශන ආයතනයේ මූල්‍ය තත්ත්වය සාධාරණව ඉදිරිපත් කර ඇති බව

02 <u>තත්ත්වාගණනය කළ මතය</u> **(Qualified Opinion)**
වාර්තාවේ සඳහන් කරුණුවලින් වන බලපෑම හැර ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව.

03 <u>මතය ව්‍යාවනය කිරීම</u> **(Disclaimer of Opinion)**
ප්‍රමාණවත් හෝ උචිත විගණන සාක්ෂි හඳුනාගැනීමට නොහැකිවීම නිසා ගිණුම් සම්බන්ධව මතයක් ප්‍රකාශ කළ නොහැකි බව.

04 <u>අහිතකර මතය</u> **(Adverse Opinion)**
ආයතනයේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
(නිවාස, ඉදිකිරීම් සහ ජලසම්පාදන අමාත්‍යාංශය)
විමර්ශනය කරන ලද දිනය - 2025.10.08

සාකච්ඡාවට ලක් කළ කරුණු

1. **අධිකාරියේ පරමාර්ථ**

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ විධිවිධාන ප්‍රකාරව අධිකාරිය විසින් සම්පූර්ණ කළ යුතු පරමාර්ථ 7 අතුරින් ප්‍රධාන පරමාර්ථ 3 පිළිබඳව කාරක සභාව පහත කරුණු නිරීක්ෂණය කළාය.

අධිකාරියේ පරමාර්ථ	කාරක සභාවට අනාවරණය වූ කරුණු	කාරක සභාවේ නිරීක්ෂණය
(ඇ) බලශක්ති ඵලෝත්පාදක ගොඩනැගිලි සහ ව්‍යුහ සැලසුම් කිරීම සහ සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමු කරමින් ඉදිකිරීම් කර්මාන්තයේ තිරසාර වර්ධනය ප්‍රවර්ධනය කිරීම.	✓ බලශක්ති කාර්යක්ෂම ගොඩනැගිලි සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සහ ප්‍රමිතීන් සැකසීම, ✓ පවතින ගොඩනැගිලි බලශක්ති ඉතිරිකිරීමේ ක්‍රමවේද හරහා යථා තත්ත්වයට පත් කිරීම. ✓ ජාතික සම්මාන යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සහ ✓ ජාතික ගොඩනැගිලි සංග්‍රහය (NBC) සකස් කිරීමේ දීර්ඝ ක්‍රියාවලියක් අනෙකුත් ආයතන සමඟ එක්ව සිදු කරමින් පවතී.	✓ මෙම අරමුණ ඉටුකිරීමට ඇති එකම ආයතනය අධිකාරිය බැවින්, කඩිනමින් සහ නිසි සැලැස්මක් සහිතව, ගෝලීය නිදර්ශක කෙරෙහි අවධානය යොමු කරමින් ක්‍රියාත්මක විය යුතු බව. ✓ ජාතික ගොඩනැගිලි සංග්‍රහය බලාත්මක කිරීම සහ සංවර්ධනය සඳහා අධිකාරිය නායකත්වය දිය යුතුය. අදාළ ක්‍රියාවලිය වේගවත් කළ යුතු බව.
(ඉ) ඉදිකිරීම් කර්මාන්තය සහ එහි සංවර්ධනට අදාළ කවර හෝ කාරණා සම්බන්ධයෙන් සුදුසු පර්යේෂණ කිරීම සහ පර්යේෂණ කටයුතු පළකිරීම සහ ව්‍යාප්ත කිරීම ප්‍රවර්ධනය කිරීම.	✓ පනත සංශෝධනය කළ පසු පර්යේෂණ අංශය තවත් ශක්තිමත් වනු ඇත.	✓ පර්යේෂණ අංශය වැඩිදියුණු කිරීමට කඩිනමින් ක්‍රියාත්මක විය යුතුය.

අධිකාරියේ පරමාර්ථ	කාරක සභාවට අනාවරණය වූ කරුණු	කාරක සභාවේ නිරීක්ෂණය
(ඊ) අනෙකුත් අදාළ අධිකාරීන් විමසා, ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රමිතීන් සකස් කිරීම සහ එම ප්‍රමිතීන් අනිවාර්ය ප්‍රමිතීන් සහ ස්වේච්ඡා ප්‍රමිතීන් වශයෙන් වර්ගීකරණය කිරීම.	✓ ජාතික ගොඩනැගිලි කේත සකස් කිරීමේදී ප්‍රමිතිකරණ කටයුතු සඳහා අනෙකුත් ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම. ✓ පනත මඟින් බලය ලබා දී තිබුණද, අනෙකුත් ආයතන මෙම කටයුත්ත නිසි බරකින් භාර නොගැනීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට අපහසු වී ඇති බව.	✓ විගණන වාර්තාවන්ට අනුව මෙම පරමාර්ථය තවමත් සම්පූර්ණ කර නොමැත.

2. අධිකාරියේ ප්‍රධාන කාර්යයන්

මෙම අධිකාරිය පිහිටුවා වසර 11ක් ගත වී ඇති නමුත් පනත මඟින් අධිකාරියට පවරා ඇති කාර්යයන් 33 න් කාර්යයන් 15ක් පමණක් සම්පූර්ණ කර ඇති බව කාරක සභාවට අනාවරණය විය. (ඇමුණුම 01 - අධිකාරියට පනත මඟින් පවරා ඇති කාර්යයන්)

3. කාර්යසාධනය - පනතේ අරමුණු හා වගන්තිවල අනුකූලභාවය

ඒ සම්බන්ධයෙන් පහත කරුණු කාරක සභාවට අනාවරණය විය.

පනතේ වගන්තිය	වර්තමාන ප්‍රගතිය
29 වැනි වගන්තිය රුපියල් මිලියන 10 හෝ ඊට වැඩි වටිනාකමකින් යුත් හඳුනාගත් ඉදිකිරීම් වැඩ පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම	දැනට පවතින දත්ත පද්ධතිය අසම්පූර්ණ වන අතර, එයට ඇතුළත් වන්නේ රජයට අනුබද්ධ ආයතනවලින් සිදු කරන ඉදිකිරීම් වැඩ පමණි
33 වැනි වගන්තිය විදේශීය උපදේශකවරුන් ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය නියම කිරීම	විදේශීය උපදේශකවරුන් ලියාපදිංචිය පිළිබඳ නියාමනයට අදාළ රෙගුලාසි (Regulation) සකස්කර 2023 දී අවසන් කර නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවට යවා ඇත.
46 වැනි වගන්තිය ප්‍රසම්පාදන කටයුතු සඳහා සම්මත ලංසු ලේඛන (Standard Bidding Documents - SBDs) පිළියෙල කිරීම හා කාලීනව සංශෝධනය කිරීම	සම්මත ලංසු ලේඛන (SBDs) දැනටමත් කිහිපවරක් සංශෝධනය කර ඇත. එම ලේඛන කමිටුවක් මඟින් සලකා බැලීම අවසන් කරමින් පවතින අතර, 2025 දෙසැම්බර් වන විට ඒවා එළිදැක්වීමට අපේක්ෂා කරයි.

පනතේ වගන්තිය	වර්තමාන ප්‍රගතිය
29 වැනි වගන්තිය රුපියල් මිලියන 10 හෝ ඊට වැඩි වටිනාකමකින් යුත් හඳුනාගත් ඉදිකිරීම් වැඩ පිළිබඳ වාර්තා පවත්වාගෙන යාම	දැනට පවතින දත්ත පද්ධතිය අසම්පූර්ණ වන අතර, එයට ඇතුළත් වන්නේ රජයට අනුබද්ධ ආයතනවලින් සිදු කරන ඉදිකිරීම් වැඩ පමණි
51 වැනි වගන්තිය කාර්මික ආරවුල් බේරුම්කරණය (Arbitration) ක්‍රියාපටිපාටි සකස් කිරීම	බේරුම්කරණ ක්‍රියාවලිය (Arbitration) අනුමත වී ඇති අතර අවසන් කිරීමට පමණක් ඉතිරිව ඇත.
55 වැනි වගන්තිය තොරතුරු ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීම සහ එහි කර්තව්‍ය හා කාර්ය පටිපාටි කාර්යසාධන ප්‍රමිති නියම කිරීම	මෙම තොරතුරු කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය වන මෘදුකාංග පැකේජය මෙම වසරේ ආරම්භ කර ඇත.

4. **<u>2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පනතට සිදු කළ යුතු සංශෝධන</u>**

පනතේ සඳහන් ප්‍රධාන කාර්යයන් පිළිබඳව පහත සඳහන් සංශෝධනයන් කළ යුතු බවත්, එකී සංශෝධනය අවසන් අදියරේ පවතින බවත් කාරක සභාවට අනාවරණය විය.

- ✓ බලාත්මක කිරීම් සම්බන්ධයෙන් පවතින ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම

  පනතේ බලාත්මක කිරීමේ බලතල ප්‍රමාණවත් නොවන බැවින්, නඩු පැවරීමට අමතරව ස්ථානීය දඩ (Spot Fine) වැනි විකල්ප ක්‍රමවේද පනතට ඇතුළත් කිරීම.

  මෙම සංශෝධනය මගින් තිරසාර බව (Sustainability) සහ තොරතුරු තාක්ෂණික දැනුම (IT knowledge) යන අංශ එක් කිරීමට අපේක්ෂා කරන බවත්, බලාත්මක කිරීම සහ පර්යේෂණ ශක්තිමත් කිරීමද එයට ඇතුළත් බව.

- ✓ අධිකාරියේ අරමුදල

- ✓ පනතේ 19 වැනි වගන්තියෙහි අධිකාරියේ අරමුදලක් පිළිබඳව සඳහන් වුවද රජයේ ප්‍රතිපත්ති හේතුවෙන් සංවර්ධන බදු (Development levies) ක්‍රියාත්මක නොවන බැවින් එම අරමුදල දැනට අක්‍රිය වී ඇති බවත්, එම නිසා සුළු හා මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන් සංවර්ධනය කිරීම ඇතුළු පනතේ වැදගත් අංගයන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බව.

5. **<u>සංයුක්ත සැලැස්ම (Corporate Plan) සහ ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීම</u>**

අධිකාරිය විසින් වත්මන් 2025 - 2029 සංයුක්ත සැලැස්ම කඩිනමින් සමාලෝචනය කර 2026 - 2030 සඳහා ' Rolling Plan' ක්‍රමයට නව සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු බව කාරක සභාව පෙන්වා දුන්නාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

I. අධිකාරිය පිහිටුවීමට අදාළ පනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීම, බඳවා ගැනීම් පටිපාටි ප්‍රතිශෝධනය කිරීම (SoR Revision), සහ දත්ත පද්ධතිය සම්පූර්ණ කිරීම ඇතුළු ප්‍රමාද වූ සියලුම පරමාර්ථ හා කාර්යයන් ඉටු කිරීම සඳහා නිශ්චිත කාලසීමාවන් සහ ක්‍රියාමාර්ග ඇතුළත් කර, ක්‍රියාකාරී සැලැස්මක් ද, Rolling Plan ක්‍රමයට නව සංයුක්ත සැලැස්මක් සකස් කිරීම.

6. <u>වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම</u>

අධිකාරිය විසින් 2023 වසරේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොමැති බව නිරීක්ෂණය කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

I. 2023, 2024 වාර්ෂික වාර්තා කඩිනමින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

7. <u>අභ්‍යන්තර විගණනය</u>

අධිකාරියෙහි අභ්‍යන්තර විගණක (සහකාර අධ්‍යක්ෂක) තනතුර වසර තුනකට වැඩි කාලයක් පුරප්පාඩු වී ඇති බවත්, විගණන අංශය එක් නිලධාරියෙකුගෙන් පමණක් සමන්විත වී ඇත. කළමනාකරණ සහකාරවරයෙකු වසර දෙකකට වැඩි කාලයක් එම තනතුරේ වැඩ බැලීම සහ බඳවා ගැනීම් ප්‍රමාද වීම අභ්‍යන්තර පාලනයට බරපතල තත්ත්වයක් බවත්, ප්‍රාදේශීය මට්ටමින් පුහුණු මධ්‍යස්ථාන 03 ක් සහිතව නිලධාරීන් 189 ක් අධිකාරියේ සේවය කරනු ලැබුවත් ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳව නිසි සමාලෝචනයක් කිරීමට නොහැකි වී ඇති බවත් කාරක සභාව නිරීක්ෂණය කළාය.

අභ්‍යන්තර විගණන අංශයේ කාර්යභාරය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සහතික කිරීමේ වගකීම 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (1) (ඊ) වන වගන්තිය අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත පැවරෙන බව විගණකාධිපතිවරයා පෙන්වා දුන්නේය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

I.

- **අධිකාරිය සඳහා යෝජිත නව කාර්ය මණ්ඩල තනතුරු අනුමත වූ වහාම අභ්‍යන්තර විගණක (සහකාර අධ්‍යක්ෂ) තනතුරෙහි පුරප්පාඩුව සම්පූර්ණ කිරීම.**
- **එතෙක් එම තනතුරේ වගකීම දැරිය හැකි සුදුසු නිලධාරියෙක් පත්කිරීම**
- **අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීම.**
- **ආයතනයේ සියලු කටයුතු අභ්‍යන්තර විගණන අංශය මඟින් විධිමත්ව විගණනයට ලක්කොට වාර්තා පවත්වා ගැනීම, ඉන් මතුවන ගැටලුකාරී තත්ත්ව සඳහා අභ්‍යන්තර පරීක්ෂණ පැවැත්වීම.**

8. **<u>කාර්ය මණ්ඩල සංයුතිය</u>**

2025.06.30 දිනට අධිකාරියේ කාර්ය මණ්ඩල සංයුතිය පහත පරිදි වන බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

සේවක කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	නිරීක්ෂණය
ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම	36	20	16	✓ අධ්‍යක්ෂ (මුදල්) සහ අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුරු **වසරකට වැඩි කාලයක සිට පුරප්පාඩුව** පවතී. ✓ එම කාර්යභාරය වැඩබැලීමේ පදනමින් **සහකාර අධ්‍යක්ෂ (මුදල්)** හා **නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන)** විසින් ඉටු කරයි. ✓ **නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ** තනතුරු **14ක්** පුරප්පාඩු වී ඇත.
මධ්‍යම කළමනාකරණ මට්ටම	71	32	39	✓ ප්‍රධාන කාර්යභාරයට සෘජුව සම්බන්ධ **ඉංජිනේරු උපාධිය සහිත නිලධාරීන් 12ක් පුරප්පාඩුව** පවතී.
කණිෂ්ඨ කළමනාකරණ මට්ටම	153	70	83	✓ නව බඳවා ගැනීම් ප්‍රමාද වීම හේතුවෙන් පුරප්පාඩු වැඩිවී ඇත.
ප්‍රාථමික මට්ටම	130	67	63	✓ සේවකයන් බහුතරයක් විශ්‍රාම ගැනීම හේතුවෙන් පුරප්පාඩු පවතී.
මුළු සේවක සංඛ්‍යාව	**390**	**189**	**201**	✓ අනුමත තනතුරු **390න්** තනතුරු **201ක් පුරප්පාඩු** පවතින බව

අධිකාරිය විසින් බඳවා ගැනීම් පටිපාටි ප්‍රතිව්‍යුහගත කිරීමේ යෝජනා 2025.04. 30 වන දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බවත්, දත්ත පද්ධති වැනි විශාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය විශේෂඥ මානව සම්පත් අධිකාරිය සතු නොවීම ප්‍රධාන ගැටලුවක් බවත් කාරක සභාවට අනාවරණය විය.

බඳවා ගැනීම් පටිපාටි සංශෝධනය, නියාමනය සහ පර්යේෂණ ශක්තිමත් කිරීමේ අරමුණින් සිදු කර ඇති බවත්, අධිකාරියට පූර්වයෙන් අනුමතව තිබූ තනතුරු 390ක් වෙනුවට 262ක් සහිත නව ව්‍යුහයක් යෝජනා කර ඇති බවත්, එහි අධ්‍යක්ෂ (පර්යේෂණ) සහ අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ) වැනි නව තනතුරු ඇතුළත් බවටත් තොරතුරු ඉදිරිපත් විය.

ක්ෂේත්‍ර නියාමනය ශක්තිමත් කිරීමට දිස්ත්‍රික් සම්බන්ධීකාරක (DCOs) වෙනුවට පළාත් සම්බන්ධීකාරක (PCOs) තනතුරක් යෝජනා කර ඇති බවත්, එමඟින් නියාමනය පළාත් සභා සහ නාගරික බලප්‍රදේශ දක්වා ව්‍යාප්ත කිරීමට බලාපොරොත්තු වන බවත් කාරක සභාවට අනාවරණය විය.

අධිකාරිය විසින් ඉල්ලා ඇති නව කාර්යමණ්ඩලයට අනුමැතිය කඩිනමින් ලබා දීමට කටයුතු සකස් කරමින් සිටින බවත්, අධිකාරියේ බඳවා ගැනීම් පරිපාටි සංශෝධන සඳහාද කඩිනමින් අනුමැතිය ලබා දීමට කටයුතු කරන බවත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ වැඩබලන අධ්‍යක්ෂවරිය ප්‍රකාශ කළාය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

I. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කර ඇති අනුමත කාර්ය මණ්ඩල සංශෝධන යෝජනාව අනුමත කිරීමට අවශ්‍ය කටයුතු කිරිම.

II. බඳවා ගැනීම් පරිපාටි සංශෝධන කඩිනමින් අනුමත කිරීමට අවශ්‍ය කටයුතු කිරිම.

III. අධිකාරියේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කඩිනමින් අවශ්‍ය කටයුතු සිදු කිරිම.

9. <u>කාර්යසාධනය - පනතේ අරමුණු හා වගන්තීන්ට අනුකූලතාවය</u>

කාරක සභාවේ නිරීක්ෂණය	ගැටලුවට හේතුව සහ අධිකාරියේ ක්‍රියාමාර්ග
<u>දත්ත පද්ධතියේ සීමාවන්</u> පනත යටතේ වාර්තා කළ යුතු පුද්ගලික අංශයේ ඉදිකිරීම් තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් නොවීම.	හේතුව - පනත යටතේ "හඳුනාගත් ඉදිකිරීම්" යටතට ගනු ලබන්නේ රුපියල් මිලියන 10ට වැඩි පොදු ගොඩනැගිලි පමණි. ක්‍රියාමාර්ග - රුපියල් මිලියන 100 කට අඩු ව්‍යාපෘති සඳහා දත්ත ඇතුළත් කිරීමට හැකිවන පරිදි මාර්ගගත මෘදුකාංගයක් සකස් කිරීමට සැලසුම් කිරීම.

කාරක සභාවේ නිරීක්ෂණය	ගැටලුවට හේතුව සහ අධිකාරියේ ක්‍රියාමාර්ග
<u>නියාමන හා බලාත්මක කිරීමේ දුර්වලතා</u> දත්ත පද්ධතියේ අසම්පූර්ණතාවය හේතුවෙන් කර්මාන්තයේ පරිහානියට හේතුවන බව සහ විදේශීය ආයෝජකයින් පිළිබඳ සොයා බැලීමක් සිදු කිරීමට නොහැකි වීම.	හේතුව - තොරතුරු නොසපයන පුද්ගලික අංශයට එරෙහිව දඬ මුදල් නියම කිරීම වැනි ක්‍රියාමාර්ග ගැනීමට පනතේ බලයක් නොමැති වීම. ක්‍රියාමාර්ග - බලාත්මක කිරීම සහ පර්යේෂණ ශක්තිමත් කිරීම සඳහා පනත සංශෝධනය කිරීමේ කටයුතු අවසන් අදියරේ පැවතීම.
පද්ධතිය ක්‍රියාත්මක කිරීමේ දුෂ්කරතා	හේතුව - 2017 දී උත්සාහ කළද සුදුසුකම්ලත් සේවා සපයන්නන්ගෙන් දුර්වල ප්‍රතිචාර ලැබීම හේතුවෙන් දත්ත පද්ධතිය ඉදිරියට ගෙන යාමට අපහසු වීම. ක්‍රියාමාර්ග - අධිකාරිය දැනටමත් අභ්‍යන්තර දත්ත පද්ධතියක් සකස් කර ඇති අතර ඉදිරියේදී එයට රජයේ ආයතනවලින් කොන්ත්‍රාත් ලබාදුන් ව්‍යාපෘති පිටපත් ඇතුළත් කිරීමට අපේක්ෂා කිරීම.

මෙම සියලු කරුණු නිරීක්ෂණය කළ කාරක සභාව අධිකාරියට පවරා ඇති කාර්යයන් සිදු කිරීමට අවශ්‍ය පරිදි පනත සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීමේ වගකීම අදාළ ආයතන ප්‍රධානීන්ට සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වෙත පැවරෙන බව පෙන්වා දුන්නාය.

10. <u>2024 වර්ෂයේ ඉලක්කගත කාර්යයන්හි ප්‍රගතිය - සංවර්ධන අංශය</u>

2024 වර්ෂයේ අධිකාරියේ සංවර්ධන අංශයේ ප්‍රගතිය පහත පරිදි විය.

	කාර්යය/ව්‍යාපෘතිය	**2024.12.31 දිනට**		
		ඉලක්ක ගත කාර්යභාරය	**ප්‍රගතිය**	**ප්‍රගතියේ ප්‍රතිශතය**
(i)	හඳුනාගත් ඉදිකිරීම් කටයුතු සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාකරුවන් ලියාපදිංචිය	2,100	4,548	216%
(ii)	දේපල සංවර්ධකයින් ලියාපදිංචි කිරීම සහ ලැයිස්තුවක් පවත්වාගෙන යාම	20	7	35%

(iii)	කර්මාන්තය නියාමනය කිරීම සඳහා තොරතුරු රැස් කිරීමට විදේශීය කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම	12	4	33%
(iv)	බලපත්‍ර පද්ධතිය විධිමත් කිරීමට සහ නියාමනය කිරීමට ඉදිකිරීම් ද්‍රව්‍ය සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම හා ලැයිස්තුවක් පවත්වාගෙන යෑම.	390	41	10%
(v)	කාර්ය සාධනය නියාමනය කිරීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින් ලියාපදිංචි කිරීම ස්ථාපිත කිරීම.	4	-	0%
(vi)	ඉදිකිරීම් ස්ථානවල සෞඛ්‍ය සහ ආරක්ෂාව, ගුණාත්මකභාවය, ව්‍යාපෘති කළමනාකරණය යනාදිය අධීක්ෂණය කිරීම සඳහා ස්ථානීය පරීක්ෂාව	385	272	71%

හඳුනාගත් ඉදිකිරීම් කටයුතු සඳහා ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය අපේක්ෂිත ඉලක්ක ඉක්මවා ගොස් ඉතා යහපත් තත්ත්වයක් පෙන්නුම් කළද, ඒ සම්බන්ධයෙන් අපේක්ෂිත ඉලක්කය සම්බන්ධයෙන් ගැටලුකාරී තත්ත්වයක් පවතින බවත්, ඉහත (ii), (iii), (iv), අංශවල ඉලක්ක ළඟා කර ගැනීමේ ප්‍රගතිය ඉතා අවම මට්ටමක පවතින බවත්, කාර්යසාධනය නියාමනය කිරීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින් ලියාපදිංචි කිරීම ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් අපේක්ෂිත ඉලක්ක කිසිවක් ළඟා කර ගෙන නොමැති බවත්, කාරක සභාව නිරීක්ෂණය කළාය.

එක් එක් අංශවලට අදාළව සකසා ඇති අපේක්ෂිත ඉලක්ක සහ ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPI) ගුණාත්මක දත්ත (Qualitative) පදනම්ව ප්‍රමාණාත්මකව (Quantitative) මැන දැක්වීම අපහසු වීම හේතුවෙන් ගැටලුවකට ලක්ව ඇති බවත්, එම ඉලක්ක පැරණි දත්ත ඇසුරෙන් ලබා දී ඇති බැවින් නැවත සලකා බැලිය යුතු බවත්, කොන්ත්‍රාත්කරුවන් අධිකාරියේ ස්වේච්ඡාවෙන් ලියාපදිංචි වන බැවින් එය අධිකාරියේ පාලනයෙන් බැහැරව ක්‍රියාත්මක වන බවත්, දේපල සංවර්ධකයින් ලියාපදිංචි කිරීමට නීතිමය අවශ්‍යතාවක් (Legal Requirement) නොමැති වීම අපේක්ෂිත ඉලක්ක ළඟා කර ගැනීමට බාධාවක් බවත්, මෙම ගැටලුව විසඳීම සඳහා, දේපල සංවර්ධන අනුමැතිය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ලබා දීමේදී අධිකාරියෙහි ලියාපදිංචි වීම අනිවාර්ය බවට පත් කරන ලෙසට යෝජනාවක් ඉදිරිපත් කර සාකච්ඡා ආරම්භ කර ඇති බව කාරක සභාවට අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

I. මෙම අංශවල අපේක්ෂිත ඉලක්ක සහ ප්‍රධාන කාර්යසාධන දර්ශකවල ගැටලු පවතී නම් ඒවා නිවැරදි කර ගැනීම හා අධිකාරියේ කාර්යසාධන ඉලක්ක ළඟා කර ගැනීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීම.

11.1 2024 වර්ෂයේ ඉලක්කගත කාර්යයන්හි ප්‍රගතිය - කර්මාන්ත සේවා අංශය

2024 වර්ෂයේ අධිකාරියේ සංවර්ධන අංශයේ ප්‍රගතිය පහත පරිදි විය.

	කාර්යය / ව්‍යාපෘතිය	ඉලක්කගත කාර්යභාරය	2024.12.31 දිනට ප්‍රගතිය		නිරීක්ෂණ
(i)	ගොඩනැගිලි ද්‍රව්‍යවල මිල උච්චාවචනය පිළිබඳව ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් ප්‍රමිතිකරණය කිරීම සඳහා මාසික ප්‍රකාශන නිකුත් කිරීම	12	11	92%	ප්‍රගතිය ඉලක්කයට ආසන්න නමුත් මාසික ප්‍රකාශන නිකුත් කිරීමේ නියමිත කාලසීමා සහ ගුණාත්මක අන්තර්ගතය තහවුරු කළ යුතු බව
(ii)	ඉදිකිරීම් කර්මාන්තයේ ආරවුල් විසඳීමේ සේවා (මැදිහත් වීම, විනිශ්චය ආදිය) සැපයීම	22	31	141%	ඉලක්කය ඉක්මවා ඇත. නමුත් ආරවුල් ඉහළ යාම කර්මාන්තයේ අසංවිධානාත්මකතාවය සහ විශ්වාසනීයත්වය දුර්වල වීමක් පෙන්වන බව
(iii)	ඉදිකිරීම් කර්මාන්තයට අදාළ පුද්ගලයින් සඳහා උපදේශන සේවා සැපයීම	800	207	26%	ඉතා අඩු ප්‍රගතියක් බවත්, කර්මාන්ත ක්ෂේත්‍රයට උපදේශන සේවා ලබා දීමේ අවශ්‍යතාවය ඇඩිව පවතින බව
(iv)	ඉදිකිරීම් කර්මාන්තයේ ඵලදායිතාව ඉහළ නැංවීමට සුදුසුකම් ලත් විනිශ්චයකරුවන් බිහි කිරීම සඳහා 20 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමකට ඩිප්ලෝමා පාඨමාලාවක් පැවැත්වීම	1	0	0%	කිසිදු ප්‍රගතියක් නොමැත. අනුමැතිය සහ අරමුදල් හිඟය හේතුවෙන් පාඨමාලාව ආරම්භ කළ නොහැකි වූ බව

	කාර්යය / ව්‍යාපෘතිය	ඉලක්කගත කාර්යභාරය	2024.12.31 දිනට ප්‍රගතිය		නිරීක්ෂණ
(v)	තාක්ෂණික විගණන ක්‍රියාවලිය සිදු කිරීම සඳහා තත්ත්ව කළමනාකරණ විගණකවරුන්ගේ හා විනිශ්චයකාරවරයන්ගේ සංචිතයක් පිහිටුවීම	58	50	86%	ප්‍රගතිය සාපේක්ෂව ඉහළය. නමුත් සම්පූර්ණ අනුමැතිය සහ ලියාපදිංචිය තවම අවසන් වී නොමැති බව
(vi)	තත්ත්ව කළමනාකරණ විගණකවරුන් විසින් තාක්ෂණික විගණන ක්‍රියාවලියන් සිදු කිරීම	10	1	10%	ඉතා අඩු ප්‍රගතියක් බව. විශේෂඥ පුද්ගලයින් හා නිලධාරී හිඟය ඊට බලපා ඇති බව
(vii)	හරිත ගොඩනැගිලි ද්‍රව්‍ය ශ්‍රේණිගත කිරීම	5	0	0%	කිසිදු ප්‍රගතියක් නොමැත. පනතේ අරමුණක් වුවත් ප්‍රායෝගික ක්‍රියාමාර්ග නොගැනීම නිසා ප්‍රගතිය අඩාල වී ඇති බව
(viii)	දිස්ත්‍රික් සම්බන්ධීකාරකවරුන් හරහා දිස්ත්‍රික්ක 25 ක දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	24	4	17%	ප්‍රගතිය ඉතා අඩු බවත්, මෙවැනි දැනුවත් කිරීමේ වැඩසටහන් වැඩි ප්‍රමාණයක් පැවැත්වීමේ අවශ්‍යතාව පවතින බව

<u>කාරක සභාවේ නිර්දේශ</u>

I. **මෙම අංශවල අපේක්ෂිත ඉලක්කවල සහ ප්‍රධාන කාර්යසාධන දර්ශකවල ගැටලු පවතී නම් ඒවා නිවැරදි කර අධිකාරියේ කාර්යසාධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීම.**

11.2 2024 වර්ෂයේ ඉලක්කගත කාර්යයන්හි ප්‍රගතිය - පුහුණු අංශය

2024 වර්ෂයේ අධිකාරියේ පුහුණු අංශයේ ප්‍රගතිය පහත පරිදි විය.

	කාර්යය / ව්‍යාපෘතිය	ඉලක්ක ගත කාර්යභාරය	2024.12.31 දක්වා ප්‍රගතිය		නිරීක්ෂණ
(i)	ඉදිකිරීම් ස්ථාන අධීක්ෂකවරුන්, මධ්‍යම මට්ටමේ තාක්ෂණික නිලධාරීන් සහ අනෙකුත් වෘත්තිකයන් ලියාපදිංචි කිරීම	800	0	0%	මෙම ක්ෂේත්‍රයේ කාර්යමණ්ඩල හිඟය සහ RPL ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන් මෙම කාර්යය ක්‍රියාත්මක නොවූ බව අනාවරණය විය.
(ii)	ඩිජිටල් දත්ත ගබඩාවක් පවත්වා ගෙන යමින් ඉදිකිරීම් ශිල්පීන් ලියාපදිංචි කිරීම සහ බලපත්‍ර ලබා දීම	500	381	76%	ඉලක්කය සපුරා ගැනීමේදී අභ්‍යන්තර දත්ත පද්ධති සීමා සහ මානව සම්පත් හිඟය බලපා ඇති බව අනාවරණය විය.
(iii)	ඉදිකිරීම් කර්මාන්තයේ ශ්‍රම බලකායේ අධීක්ෂණ, කළමනාකරණ සහ අනෙකුත් වෘත්තීය කාණ්ඩවල පුද්ගලයින් සඳහා පුහුණුව ලබා දීම	830	67	8%	පුහුණු වැඩසටහන්වල අඩු ප්‍රගතියට හේතුව නේවාසික පහසුකම් සීමා සහ ආයෝජන අඩුවීම බව අනාවරණය විය.
(iv)	පෙර ඉගෙනුම් පිළිගැනීමේ (RPL) වැඩසටහන හරහා ඉදිකිරීම් ශිල්පීන්ට NVQ සහතික ලබා දීම	750	419	56%	RPL වැඩසටහන තවමත් අර්බුදයක පවතින අතර, පාලන අංශයන් අතර සම්බන්ධතාවක් නොමැති වීම හේතුවෙන් කාර්ය සාධනය අඩු වී ඇත.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

I. ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) සහ මෙහෙයුම් ශිල්පී විද්‍යාලය (OTC) යන පුහුණු ආයතන සතුව රටට සහ කලාපයටම වැදගත් වන අනෙකුත් ආයතනවලට නොමැති ඉදි කිරීමේ යන්ත්‍රෝපකරණ සම්බන්ධ පහසුකම් ඇති බැවින්, මෙම ආයතනවල ධාරිතාව (Capacity) උපරිමයෙන් ප්‍රයෝජනයට ගැනීම.

II. **භාවිතයේ පවතින තාක්ෂණික අංග සහ යන්ත්‍රෝපකරණ යල් පැන ගොස් ඇති බැවින්, ඒවා ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ජපාන ආධාර (JICA) යටතේ ඉදිරිපත් කර ඇති ව්‍යාපෘති යෝජනා (Project Proposals) කඩිනමින් ක්‍රියාත්මක කිරීම.**

III. **දැනුම හා නිපුණතා ඇතත් වෘත්තීය සහතිකයක් නොමැති ශිල්පීන් සඳහා, ඉගෙනුම් පිළිගැනීම් වැඩසටහන (Recognition of Prior Learning - RPL) ප්‍රවර්ධනය කිරීමට සහ ජනප්‍රිය කිරීමට විශේෂ අවධානයක් යොමුකිරීම.**

IV. **අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වී ක්‍රියාත්මක කරනු ලබන 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහනේ සාර්ථකත්වය සහ ප්‍රගතිය (2018 සිට ආරම්භ වූ) නිතිපතා අධීක්ෂණය කිරීම හා ඒ සම්බන්ධයෙන් ප්‍රගතිය කාරක සභාවට සහ විගණකාධිපතිට වාර්තා කිරීම.**

V. **පාසල් පද්ධතිය තුළ මෙම වෘත්තීය ක්ෂේත්‍ර ජනප්‍රිය කිරීම සඳහා වැඩිදුර උපදේශන සේවා/දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.**

12. <u>PPP ආකෘතිය යටතේ කුසලතා පුහුණු වැඩසටහන් සහ වියදම්</u>

මේ සම්බන්ධයෙන් කාරක සභාව පහත කරුණු නිරීක්ෂණය කළාය.

	2024	2023	2022	2021	2020
	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.	රු.මි.
PPP ආකෘතිය යටතේ ඉදිකිරීම් කර්මාන්තය සඳහා කුසලතා පුහුණුව	6.1	13.15	48.30	79.60	185.75

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) සහ ඉදි කරන්නන්ගේ සංගමය සමඟ එක්ව, භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ මෙම වැඩසටහන සිදු කර ඇති බවත්, පුහුණුලාභීන්ට මාස 3ක් සඳහා රුපියල් 10,000ක මාසික දීමනාවක් ගෙවා ඇති බවත්, 2020න් පසු 3,601ක් ලියාපදිංචි වී 3,443ක් පුහුණුව සම්පූර්ණ කර ඇති බවත් අනාවරණය විය.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

I. **මෙම පුහුණු වැඩසටහනට අදාළ සම්පූර්ණ ක්‍රියාවලිය, වියදම් සහ පුහුණු වූ ප්‍රමාණය පිළිබඳව විස්තරාත්මක වාර්තාවක් විගණකාධිපතිවරයාට පිටපත් සහිතව කාරක සභාවට ඉදිරිපත් කිරීම.**

13. <u>අධිකාරියේ අධ්‍යක්ෂ (මුදල්) අනිවාර්යය නිවාඩු යැවීමට සම්බන්ධ නඩු කටයුතු හා ඒ සම්බන්ධ වියදම්</u>

අධිකාරියේ හිටපු සභාපතිගේ උපදෙස් නොතකා අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ (මුදල්) වාහන දීමනාව දිගටම ලබා ගැනීම සහ අරමුදල් නියමිත පරිදි භාණ්ඩාගාරයට භාර නොදීම යන මූලික චෝදනා මත 2021.10.08 දින සිට අනිවාර්ය නිවාඩු යවා තිබූ බවත්, ඔහුට එරෙහිව

මූලික විමර්ශනයක් නොපවත්වා 2021 දෙසැම්බර් මාසයේදී ඔහුව සේවයෙන් පහ කර ඇති බවත්, සේවයෙන් පහ කිරීමට පෙර ඒ සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් ගෙන නොතිබුණද, පසුව 2022 ජනවාරි මාසයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එය අපරානුමත කර (Ratify) ඇති බවත්, කාරක සභාව නිරීක්ෂණය කළාය.

මෙම සේවයෙන් පහ කිරීමට එරෙහිව අධිකාරියේ හිටපු අධ්‍යක්ෂ (මුදල්) නීතිමය ක්‍රියාමාර්ගවලට යොමු වී ඇති අතර, 2022.07.29 දින අභියාචනාධිකරණ තීන්දුව මඟින් ඔහුට නීත්‍යානුකූලව හිමි සියලු දීමනා හා සේවා කොන්දේසි යටතේ නැවත සේවයේ පිහිටුවන ලෙස නියෝග කර ඇති නමුත් අධිකාරිය මෙම තීන්දුව ක්‍රියාත්මක නොකර, හිටපු සභාපතිගේ බලපෑම මත සහ නීති අංශයේ උපදෙස් ලබා ගැනීමකින් තොරව, අධිකාරිය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවත්, එම අභියාචනය පසුව 2024 මාර්තු මාසයේදී අධිකාරිය විසින් ඉල්ලා අස්කර ගෙන ඇති බවත්, හිටපු මුදල් අධ්‍යක්ෂ විසින් හිටපු සභාපතිට එරෙහිව පෞද්ගලිකව අපහාස නඩුවක් ගොනු කර ඇති බවත් කාරක සභාවට අනාවරණය විය.

2025 අගෝස්තු වන විට හිටපු මුදල් අධ්‍යක්ෂගේ නඩු කටයුතු සම්බන්ධයෙන් අධිකාරිය විසින් රුපියල් මිලියන 15.01ක් පමණ වියදම් කර තිබූ අතර ඒ තුළ පහත දැක්වෙන ගෙවීම් ඇතුළත් විය.

	නෛතික ගැටලුව	වියදම (රු.)	විස්තර
(i)	මුදල් අධ්‍යක්ෂවරයා විසින් සභාපතිට එරෙහිව පෞද්ගලිකව ගොනු කළ නඩුව	420,000	අධිකාරිය විසින් මෙම නඩු කටයුතු සඳහා වියදම් දරා ඇත.
(ii)	සේවය අවසන් කිරීමට විරුද්ධව අධිකාරියට එරෙහිව ගොනු කළ නඩුව	1,615,000	තීන්දුව – රු. 1,723,181 ක හිඟ වැටුප් ගෙවා, නිලධාරී නැවත සේවයේ පිහිටුවීම.
(iii)	ඉහත තීන්දුව ක්‍රියාත්මක නොකොට ඉදිරිපත් කළ අභියාචනය	1,750,000	අධිකාරිය විසින් අභියාචනය ඉදිරිපත් කළ ද, පසුව එම අභියාචනය අධිකාරිය විසින්ම ඉවත් කර ගෙන ඇත.
(iv)	ඉහත (ii) හි තීන්දුව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට එරෙහිව ගොනු කළ නඩුව	10,820,000	මෙම නඩුව මෙතෙක් අවසන්ව නොමැති අතර, සෑම නඩුවාරයකදීම රු. 625,000 ක වියදමක් දරයි.
(v)	කම්කරු උසාවියේ නඩුව	275,000	අමතර නඩුවක් ලෙස අධිකාරිය වියදම් දරා ඇත.

	නෛතික ගැටලුව	වියදම (රු.)	විස්තර
(vi)	පොදු නීති සේවා වියදම්	135,000	අමතර නීතිඥ ගාස්තු සහ නීති උපදේශන ගාස්තු අධිකාරිය විසින් දරා ඇත.
මුළු වියදම		**රු. 15,015,000 (මිලියන 15.01) පමණ.**	

මේ සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ කාරක සභාව, අධිකාරිය විසින් පහත සඳහන් වැරදි සිදු කර ඇති බව පෙන්වා දුන්නාය.

- **පත්වීම් බලධාරියා සහ විනය බලධාරියා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියකින් තොරව, සේවකයින්ගේ සේවයට බලපාන තීරණ ගැනීම, මුදල් අධ්‍යක්ෂවරයා සේවයෙන් පහකිරීමේදී මූලික විමර්ශනයක්, චෝදනා පත්‍රයක් හෝ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් තොරව කටයුතු කිරීම දෝෂ සහිත බව සහ එසේ කටයුතු කිරීම හේතුවෙන් ආයතනයට එරෙහිව නඩු පැවරීමට පදනමක් නිර්මාණය වී ඇති බව,**

- **මහා භාණ්ඩාගාර ලේකම්ගේ අංක PE/COP/POLI/Circulars හා 2015.05.25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2015 සහ එය සංශෝධනය කර ඇති මහා භාණ්ඩාගාර ලේකම්ගේ අංක PE/COP/POLI/Circulars හා 2016.10.27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 01/2015(i) චක්‍රලේඛයේ 3.3 ඡේදයේ විධිවිධාන ප්‍රකාරව නිල වාහනයක් භාවිතා කිරීමට අයිතිය ඇති නිලධාරියෙකුට, එම නිල වාහනය භාවිතා කිරීම හෝ රුපියල් 50,000 ක මාසික දීමනාවක් සහ තනතුරට අදාළ මාසික ඉන්ධන දීමනාවක් ලබා ගැනීම යන දෙකෙන් එකක් තෝරා ගැනීමේ හිමිකම තිබිය දී ඒ සම්බන්ධයෙන් මුදල් අධ්‍යක්ෂවරයා වෙත චෝදනා කර ඇති බව,**

- **පොදු අධිකාරීන් සියල්ල මුදල් අමාත්‍යාංශය ඇතුළු රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛවලට අනුගතව කටයුතු කළ යුතු බවට අධිකරණය පවා නියෝග කර තිබියදී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නීති විරෝධී තීරණ මත පුද්ගලික පළිගැනීම්ලට මහජන මුදල් නාස්ති කර ඇති බව.**

<u>කාරක සභාවේ නිර්දේශ</u>

I. හිටපු මුදල් අධ්‍යක්ෂවරයා සම්බන්ධ නඩු කටයුතු හේතුවෙන් අධිකාරියට දැරීමට සිදුවූ රුපියල් මිලියන 15.01 කට අධික වියදම් සම්බන්ධයෙන් පහත කරුණුද ආවරණය වන පරිදි අමාත්‍යාංශ මට්ටමින් ස්වාධීන පරීක්ෂණයක් ඉතා කඩිනමින් පැවැත්වීම,

- **නඩු කටයුතු පවත්වාගෙන යාමේදී නීතිමය ක්‍රමවේද නිසි ලෙස අනුගමනය කර ඇත්ද,**

- **අධිකරණ නියෝග වහාම ක්‍රියාත්මක නොකිරීමට ගත් තීරණයට වගකිව යුත්තේ කවුරුන්ද**

II. වගකිව යුතු නිලධාරීන්ගෙන් මෙම මුදල නැවත රජයට අයකර ගැනීම.

III. පත්වීම් බලධාරියා (Appointing Authority) සහ විනය බලධාරියා (Disciplinary Authority) ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය අනාගතයේදී සේවකයින් සේවයෙන් පහ කිරීමට හෝ අනිවාර්ය නිවාඩු යැවීමට පෙර නිසි ක්‍රමවේදය අනුගමනය කිරීම.

IV. පරිපාලන සහ විනය කටයුතු සම්බන්ධව සියලු නිලධාරීන් දැනුවත් කිරීම.

14. <u>අධිකාරියේ ප්‍රධාන කාර්යාලය පිහිටි ඉඩම සහ ගොඩනැගිල්ල</u>

කරුණ	කාරක සභාවේ නිරීක්ෂණය	අමාත්‍යාංශය/අධිකාරියේ කරුණු දැක්වීම
අධිකාරිය සහ ටවර් හෝල් පදනම අතර ඇති බදු ගිවිසුම	2016 න් පසු බදු කුලිය සංශෝධනය කිරීමකින් තොරව 2019 දී තවත් වසර 30ක කාලයක් සඳහා බදු ගිවිසුමකට එළඹ ඇති බව. (මුල් ගිවිසුම - 1986).	✓ ගොඩනැගිල්ල ඉදිකර ඇත්තේ දෙපාර්ශවය සඳහා අමාත්‍යාංශ වියදමින් බව ✓ නව ගිවිසුමේ ශාස්තු තක්සේරුවක් නොතිබූ බව ✓ ටවර් හෝල් පාර්ශවයට අසාධාරණයක් සිදුව ඇතැයි මතයක් ඇති බව
හිඟ බදු මුදල් හා ඉවත් කිරීම	ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල තීරණයෙන් රු. මිලියන 145ක හිඟ මුදල ගෙවීමට හා අධිකාරියේ කාර්යාලය ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC) වෙත විතැන් කිරීමට නියම කර ඇති බව. අධිකාරිය රු. මිලියන 25ක් ගෙවා ඇති බව.	✓ රු. මිලියන 145 හිඟ මුදල ගණනය කළ ආකාරය අධිකාරිය දැනුවත් නැති බව ✓ අධිකාරියේ කාර්යාලය සාථානගත කිරීමට එහි ප්‍රමාණවත් ඉඩක් නැති බව.
ඉදිකිරීම් උපකරණ පුහුණු	අධිකාරියේ කාර්යාලය ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය වෙත	✓ ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානයට අයත් ඉඩම

කරුණ	කාරක සභාවේ නිරීක්ෂණය	අමාත්‍යාංශය/අධිකාරියේ කරුණු දැක්වීම
මධ්‍යස්ථානය වෙත මාරු කිරීම	ස්ථානගත කිරීමට අවශ්‍ය කටයුතු කරන ලෙස අමාත්‍යාංශ ලේකම්වරයා විසින් දන්වා ඇති බව.	සම්බන්ධයෙන්ද විධිමත් බදු ගිවිසුමක් නොමැති බැවින් එම ස්ථානයට මාරු කිරීම මතභේදාත්මක තත්ත්වයක් බව.
ගැටලුව විසඳීමට ගත් උත්සාහයන්	අමාත්‍ය මණ්ඩල තීරණ තිබියදීත්, ගැටලුව තවමත් නොවිසඳුණු ප්‍රශ්නයක් ලෙස පවතින බව.	✓ රාජ්‍ය ආයතන දෙකක් බැවින් සාකච්ඡා කර මෙම ගැටළුව විසඳා ගැනීමට නීතිපති දෙපාර්තමේන්තුව උපදෙස් දී ඇති බව. ✓ අග්‍රාමාත්‍යතුමියගේ ප්‍රධානත්වයෙන් පැවති සාකච්ඡාවකින් ද එකඟතාවකට පැමිණීමට නොහැකි වී ඇති බැවින් නැවත නීතිපති වෙත යොමු කර ඇති බව.
අමාත්‍යාංශ ලේකම්ගේ ස්ථාවරය	-	✓ කමිටු සාකච්ඡාවලින් පසුව එවන ලද එකඟතා ප්‍රකාශයේ කරුණු නිවැරදි නොවීම හේතුවෙන් එය අත්සන් නොකළ බවත්, ගැටලුව සාධනීය ලෙස සාකච්ඡා මඟින් අවසන් කළ යුතු බවත් සඳහන් කළ බව.

<u>කාරක සභාවේ නිර්දේශ</u>

I. ගැටලුව සාධාරණව විසඳීම සඳහා ගොඩනැගිල්ලේ වටිනාකම් තක්සේරුවක් (Valuation) ලබා ගැනීම හා දෙපාර්ශවයටම අසාධාරණයක් නොවන පරිදි ගිවිසුම අවසන් කරගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

15. අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ වහලය අළුත්වැඩියාව

අධිකාරියේ ගොඩනැගිල්ලේ වහලය වසර 35කට අධික කාලයක් පැරණි බවත්, එය අලුත්වැඩියා කිරීමට රුපියල් මිලියන 20ක් අවශ්‍ය වන බවට ඇස්තමේන්තුගත කර තිබූ බවත්, අධිකාරිය සතු අරමුදල් හිඟය හේතුවෙන් අළුත්වැඩියාව සඳහා වියදම් කිරීමට හැකියාව තිබුණේ රුපියල් මිලියන 4ක පමණ සීමිත මුදලක් පමණක් බවත්, එම හදිසි අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමින්, අධිකාරිය ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා ඇති බවත්, ලැබුණු අඩුම මිල ඉදිරිපත් කළ C7 ශ්‍රේණියේ කොන්ත්‍රාත්කරු සමඟ සාකච්ඡා කර රුපියල් මිලියන 5.9ක් දක්වා මුදලක් යටතේ වැඩ කටයුතු ඉටු කිරීමට තීරණය කළ බවත් කාරක සභාවට අනාවරණය විය.

16. අධිකාරිකයට පරිගනක මිලදී ගැනීම

2021 දී වෙළඳපොළ මිල රු. 100,000ක් පමණ වූ ලැප්ටොප් පරිගණකයක් රුපියල් 240,000ක් බැගින් පරිගණක 21ක් මිලදී ගෙන ඇති බවත්, එම පරිගණක දෝෂසහිත බවත් කාරක සභාවට තොරතුරු ඉදිරිපත් කර තිබුණි. මේ සම්බන්ධයෙන් කරුණු දක්වමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා සඳහන් කළේ, පරිගණක 16ක් පමණක් දෙවන අඩුම ලංසුව ඉදිරිපත් කළ ආයතනයෙන් මිලට ගත් බවත් (අවම ලංසුවට වඩා රු. 88,500ක් වැඩියෙන්), පරිගණක කිහිපයක පමණක් Hinge දෝෂය තිබූ බවත් බවත්, Hinge දෝෂය පරිගණක කිහිපයක පමණක් තිබූ බවත්, ඒවා සැපයුම්කරු විසින් අලුත්වැඩියා කර දුන් බවත්, දැනට ඒවායෙහි දෝෂ නොමැති බවත්ය කාරක සභාව නිරීක්ෂණය කළාය.

කාරක සභාවේ නිර්දේශ

I. මෙම ලැප්ටොප් පරිගණක 16 මිලදී ගැනීම සහ ඒ සඳහා වියදම් කර ඇති මුදල සාධාරණද යන්න පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් කාරක සභාවට සහ විගණකාධිපතිවරයාට ඉදිරිපත් කිරීම.

17. අධිකාරියේ අභ්‍යන්තර ගැටලු සහ විනය පරීක්ෂණ

අධිකාරිය සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට පෙත්සම් රාශියක් ඉදිරිපත් වී ඇති බවත්, ආයතනයේ නිලධාරීන් අතර බරපතල අසමඟියක්, නිරන්තර ගැටුම් ඇති කර ගැනීමේ ස්වභාවයක් මෙන්ම, එකිනෙකාට විරුද්ධව විනය පරීක්ෂණ පැවැත්වීමේ ස්වරූපයක් ඇති බවත්, මෙම චෝදනා පත්‍ර බොහෝමයක් තුළ මූල්‍යමය කරුණු නොව, පරිපාලනමය හා සන්නිවේදනමය ගැටලු ඉදිරිපත් කර ඇති බව මේ සම්බන්ධයෙන් කරන ලද විමසීමේදී කාරක සභාවට අනාවරණය විය.

කාරක සභාවේ නිර්දේශ

I. මෙම ආයතනයේ පවතින මූලික පරීක්ෂණ, විධිමත් විනය පරීක්ෂණ සියල්ලම සම්බන්ධයෙන් මූල්‍යමය චෝදනා සහ මූල්‍යමය නොවන චෝදනා වෙන් කර, තවදුරටත් පැවැත්විය යුතු පරීක්ෂණ මොනවාද යන්න තීරණය කිරීම සඳහා අමාත්‍යාංශය මඟින් විශේෂ කමිටුවක් පත් කිරීම සහ මූල්‍යමය නොවන චෝදනා සම්බන්ධයෙන් පවතින පරීක්ෂණ සහ අනෙකුත් සියලු පරීක්ෂණ කඩිනමින් සිදු කර අවසන් කිරීම.

II. **යම් නිලධාරියෙකු අසද්භාවීව වැරදි ලෙස පෞද්ගලික පළිගැනීම් සඳහා චෝදනා කිරීම්, මූලික විමර්ශන පැවැත්වීම් හෝ චෝදනා පත්‍ර නිකුත් කිරීම් සිදු කර ඇත්නම් එම නිලධාරීන්ට එරෙහිව විනය පියවර ගැනීම.**

III. **ආයතනයේ කාර්ය සාධන ඉලක්ක ළඟා කර ගැනීමට හා ඉහළ නංවා ගැනීමට අවශ්‍ය අභ්‍යන්තර පරිසරය මෙම අධිකාරියේ ඇති කිරීමට අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීම.**